Department of Education, Sabaragamuwa Province/ Weekly School

## පුනරීක්ෂණ අභ්‍යාස

**නිපුණතාවය 13 අදාල පසුගිය විභාග ප්‍රශ්න**

### 2008

I. රැකබලා ගන්නෙකු විසින් ළදරුවෙකුගේ චාලක වර්ධනය සඳහා ගත යුතු ක්‍රියා මාර්ග දෙකක් ලියන්න.

II. මාස 2, 4, 6, සම්පූර්ණ වෙත්ම ජාතික ප්‍රතිශක්තිකරණය වැඩසටහනට අනුව ලබා දෙන එන්නත් මොනවාද?

III. ළදරු වියේදී ලබා දෙන ක්‍රීඩා භාණ්ඩ වල තිබිය යුතු ලක්ෂණ පැහැදිලි කරන්න.

### 2009

I. දරුවා තුල යහපත් පුරුදු වර්ධනය සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් තුලින් ගන්නා ක්‍රියා මාර්ග 04ක් ඉදිරිපත් කරන්න.

II. මාතෘ සායනයට මව නිතිපතා සහභාගී නොවීම නිසා දරුවාට ඇති විය හැකි අහිතකර බලපෑම් දෙකක් දක්වන්න.

III. දරුවා පිළිසිඳ ගැනීම සඳහා ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය මනාව සකස් වී ඇත. ස්ත්‍රී හා පුරුෂ ප්‍රජනන හෝමෝන නම් කර ඒවායින් ඉටුවන කාර්යය බැගින් සඳහන් කරන්න.

IV. දරුවෙකු පිළිසිඳ ගැනීමේදී ස්ත්‍රී ප්‍රජනන පද්ධතිය තුල සිදුවන වැදගත් ක්‍රියාවලි දෙකක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

V. ගර්භනී අවධියේදී ඇතිවන ඌණ පෝෂණ තත්වය බිහිවන දරුවාට හා මවට බලපාන අයුරු සාකච්ඡා කරන්න.

### 2010

I. මාස 9 ක පුතෙකු සිටින මවක් තම දරුවා රැකබලා ගැනීමේදී අනුගමනය කරන ක්‍රියාමාර්ග 03ක් සඳහන් කරන්න.

II. එම මව අනුගමනය කරන ක්‍රියාමාර්ග 02 ක වැදගත්කම පහදන්න.

III. පූර්ව ප්‍රසව සංවර්ධනයට ඇතුලත් භ්‍රෑණ අවධිය පිලිබඳ කෙටි සටහන් ලියන්න.

IV. නිරෝගී දරු උපත් සඳහා ගර්භනී මවක් පෝෂණයට අමතරව සැලකිලිමත් විය යුතු වෙනත් කරුණු තුනක් පැහැදිලි කරන්න.

V. ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ පහත සඳහන් ඉන්ද්‍රිය මගින් සිදුවන කාර්යභාරය විස්තර කරන්න.
ඩිම්බ කෝෂ ගර්භාෂය